# රුහුණ විශ්වවිද්‍යාලය

## ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පාඨමාලාව - 2017/2018

### දෙවන සමාසික අවසාන පරීක්ෂණය

## MAE 5201 - රාජ්‍ය කටයුතු ආර්ථික විද්‍යාව

ප්‍රශ්න <u>හතරකට (04)</u> පමණක් පිළිතුරු සපයන්න.

එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න දෙකක් තෝරා ගත යුතුයි.

**කාලය: පැය 03 යි.**

---

<u>කොටස I</u>

01. i. කාර්යක්ෂම බදු ක්‍රමයක පැවතිය යුතු ගුණාංග පිළිබඳ විග්‍රහයක යෙදෙන්න.
(ලකුණු 08)

ii. ශ්‍රී ලංකා බදු ව්‍යුහයේ මෑත කාලීන උපනති පරීක්ෂා කරන්න.
(ලකුණු 07)

02. i. බදු ආපාතය සහ අයවැය ආපාතය අතර වෙනස පැහැදිලි කරන්න.
(ලකුණු 07)

ii. බදු විතැන් කිරීම කෙරෙහි වෙළෙඳපොළ ව්‍යුහයේ ස්වරූපය සහ ඉල්ලුම් හා සැපයුම් නම්‍යතා බලපාන ආකාරය පෙන්වා දෙන්න.
(ලකුණු 08)

03. පහත සඳහන් ඒවායින් ඕනෑම තුනකට විස්තරාත්මක සටහන් ලියන්න.

(අ) බදු පැහැර හැරීම හා බදු මඟ හැරීම
(ආ) රාජ්‍ය ණය කළමනාකරණය
(ඇ) එකතු කළ අගය මත බදු අයකිරීම (VAT)
(ඈ) ලිහිල් කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය යටතේ ශ්‍රී ලංකාවේ රාජ්‍ය මූල්‍ය ප්‍රතිසංස්කරණය
(ලකුණු 5x3)

<u>කොටස II</u>

04. (i) රාජ්‍ය වියදම් ඇගයීමේ දී සලකා බැලිය යුතු ප්‍රධාන සාධක කවරේ ද?
(ලකුණු 05)

(ii) "හැමවිට රජය මහා පරිමාණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පෙර වියදම් ප්‍රතිලාභ විග්‍රහය පිළිබඳ මහත් අවධානයක් යොමු කළ යුතු වේ." මෙම ප්‍රකාශය වියදම් ප්‍රතිලාභ විග්‍රහ මූලධර්මවලට අනුව විග්‍රහ කරන්න.
(ලකුණු 05)

(iii) පහත සඳහන් මහා පරිමාණ යෝජනා ක්‍රමවල වාසි හා අවාසි ලියන්න.
(අ) මත්තල ගුවන් තොටුපළ
(ආ) මොරගහකන්ද කළු ගඟ යෝජනා ක්‍රමය
(ලකුණු 2.5 x 2)

05. (i) ශ්‍රී ලංකාවේ මෑත කාලීන ව අත්විඳින පුළුල් හිඟ අයවැය තත්ත්වයේ ආර්ථික ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ii) රාජ්‍ය මූල්‍යයේ ප්‍රාග්ධන ගිණුමේ ඇති වැදගත්කම කුමක් ද? ශ්‍රී ලංකාවේ මෑත කාලීන අත්දැකීම් ඇසුරින් විග්‍රහ කරන්න.

(ලකුණු 08)

06. (i) රාජ්‍ය ණය වර්ධනයට හේතු කවරේ ද?

(ලකුණු 05)

(ii) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය වර්ධනයේ ප්‍රතිවිපාක පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(iii) වර්තමාන ශ්‍රී ලංකාවේ රාජ්‍ය ණය වර්ධනය අඩු කළ හැක්කේ කෙසේ ද?

(ලකුණු 05)

@@@@@@@@@